# ආණ්ඩුව තුළ පාලනය ගැන මහජනයා අතර පවතින හැඟීම යහපත් නො වේ

***2015 නොවැම්බර් 9, කොළඹ, ශ්‍රී ලංකාව:*** විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA) මෑත දී වාර්තා වූ රටේ පාලනයට හානිකර ලෙස බලපාන සිදුවීම් දෙක - එනම් ඩිප්ලෝමා ශිෂ්‍යයන්ට එල්ල කළ පොලිස් ප්‍රහාරය සහ ඇවන් ගාඩ් විමර්ශනයට අදාළව පාර්ලිමේන්තුව තුළ සිදු වෙමින් පවතින දෙය - හේතු කොට ගෙන කනස්සල්ලට පත්ව සිටින අතර එම සිදුවීම් හෙළා දකී.

පළමු සිදුවීම ගත් විට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පොලිස් ප්‍රහාරය මුළුමනින් ම හෙළා දකින බව කිව යුතු ය. ඕනෑ ම ක්‍රියාත්මක ප්‍රජාතන්ත්‍රවාදයක් තුළ දී පොලීසියේ වගකීම වන්නේ තම මූලික අයිතිවාසිකම් භුක්ති විඳිමින් සිටින පුරවැසියන් ආරක්ෂා කිරීම මිස මෑත පැවති ඒකාධිපතිවාදී පාලනය සිහි කරවන ක්‍රියාවන් හරහා ඔවුන්ට දරුණු ලෙස ප්‍රහාර එල්ල කිරීම නො වේ. පොලීසියට එය කළ ආකාරයෙන් බලය යොදා ගැනීමට නියෝග ලැබී තිබුණේ ද, එසේ නම් එම නියෝග නිකුත් කරන ලද්දේ කවුරුන් විසින් ද? එසේ නැත් නම් පොලීසිය තමන් රිසි පරිදි ක්‍රියා කරමින් පෙර පැවති තන්ත්‍රය නියෝග සහ/හෝ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි ලෙස පැනවීමට ඉඩ තිබූ දෙය කරා ආපසු යමින් සිටියේ ද? ප්‍රහාරය සම්බන්ධයෙන් අගමැතිවරයා හා මානව හිමිකම් කොමිසම විසින් ද ඇතුළුව විමර්ශනයන් ගණනාවකට නියෝග කර ඇති බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සැලකිල්ලට ගනී. මෙම විමර්ශනයන් සම්පූර්ණයෙන් හා කඩිනමින් නිම විය යුතු බවත් ඒවායේ වාර්තා ප්‍රසිද්ධ කළ යුතු බවත් බියකින් හෝ අනුග්‍රහ දැක්වීමකින් තොරව වගකිව යුත්තන් නීතියට හමුවට පැමිණවිය යුතු බවත් අපි විශ්වාස කරමු.

දෙවන සිදුවීම ඇවන් ගාඩ් සිද්ධියට අදාළව පාර්ලිමේන්තුව තුළ සිදු වෙමින් පවතින විවාදය සමග ද අන් කිසිවෙකු නො ව නීතිය හා සාමය පිළිබඳ ඇමතිවරයා විසින් ම එම ආයතනය ආරක්ෂා කිරීම සමග ද විමර්ශනයේ දී තම විෂය පථය යටතේ පවතින ආයතනයක් වන පොලීසිය ඉටු කළ කාර්ය භාරය ඇමතිවරයා විසින් හානිකර අන්දමින් විවේචනය කරනු ලැබීම සමග ද සම්බන්ධ ය. මේ හැරුණු විට මෙම සිදුවීමට අදාළව හිටපු ආරක්ෂක ලේකම්වරයා අත් අඩංගුවට ගැනීම වැළැක්වීමට සඳහා තමන් ක්‍රියා කළ බවට අධිකරණ ඇමතිවරයා නිකුත් කළ ප්‍රකාශය ද පවතී. එපමණක් නො ව මෙම විමර්ශනයට බාධා කිරීම සම්බන්ධයෙන් වෙනත් ඇමතිවරයෙකු විසින් කරන ලද චෝදනා ද පවතී. මාධ්‍ය වාර්තා ප්‍රකාශ කරන්නේ පාර්ලිමේන්තුව තුළ සිදු වූ විවාදයෙන් පසුව කැබිනට් මණ්ඩලයේ දී ද ගැටලුව පිළිබඳව තව දුරටත් තියුණු සාකච්ඡාවක් ඇති වූ බව සහ සමහර ඇමතිවරුන් තම සගයන් පාර්ලිමේන්තුවේ දී කළ ප්‍රකාශ හේතුවෙන් ඉල්ලා අස් වීමට තර්ජනය කළ බව ය. කැබිනට් මණ්ඩලය මේ ගැන නැවත ද හමු වී සාකච්ඡා කිරීමට නියමිතව ඇත.

විමර්ශනය තුළ දී විසඳා ගත යුත්තේ මෙම සිදුවීමට අදාළව නඩු පැවරීමට පදනමක් තිබෙන්නේ ද එසේ නම් ඒ කවර නීතියක් යටතේ ද යන්න සහ ඒ අනුව එම නඩුව අපරාධ හෝ සිවිල් නඩුවක් විය යුතු ද යන්න යි. නීතිපතිවරයාගේ මතය වී ඇත්තේ ගිනි අවි ආඥා පණත හෝ ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ නඩු පැවරිය නොහැකි බව ය. ඇමතිවරුන් දෙදෙනා ඊට එකඟ වී ඇත. වඩාත් ම වැදගත් වන්නේ සිද්ධිය තුළ සැබවින් ම ගැබ් වන දෙය යි. එනම් ඇමති ධුරය භාර ගැනීමට පෙර ඇවන් ගාඩ් ආයතනය වෙනුවෙන් පෙනී සිටි බැවින් නීතිය හා සාමය පිළිබඳ ඇමතිවරයාගේ පාර්ශ්වයෙන් බැඳියාවන් අතර ගැටුමක් පවත්නා බව ප්‍රකාශ වීම, ඔහු සිය පූර්ව සේවාදායකයා ආරක්ෂා කිරීම සඳහා පාර්ලිමේන්තු කාලය හා වරප්‍රසාද යොදා ගැනීම සහ ඔහු විසින් පොලීසිය විවේචනය කරනු ලැබීම යි. ඔහු පාර්ලිමේන්තුවේ දී කළ ප්‍රකාශය බැඳියාවන් අතර ගැටුම ආණ්ඩුව තුළ පාලනයේ ප්‍රධාන හා අත්‍යවශ්‍ය අංගයක් බව මුරණ්ඩු සහගත ලෙස නො තකා හැරීමකි. එමෙන් ම ජනවාරියේ පැවති ඓතිහාසික මැතිවරණයෙන් සහ ඉන් සත් මසක් ගෙවී ගිය තැන එය යළි ශක්තිමත් කිරීමෙන් පසුව පාලනය සහිත දේශපාලන සංස්කෘතියක් ප්‍රවර්ධනය කරනු ඇති බවට කවර හෝ ප්‍රාර්ථනාවක් වී නම් එය නිර්ලජ්ජිත ලෙස ප්‍රතික්ෂේප කිරීමකි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නීතිය හා සාමය පිළිබඳ ඇමතිවරයා ඉල්ලා අස් විය යුතු යැයි ද විමර්ශනයේ දී ඔහු ඉටු කළ නිශ්චිත කාර්ය භාරය කුමක් ද යන්න පිළිබඳව අධිකරණ අමාත්‍යාංශය නොපමාව පැහැදිලි ප්‍රසිද්ධ ප්‍රකාශයක් නිකුත් කළ යුතු යැයි ද ඉල්ලා සිටී.

මේ රටේ පුරවැසියෝ පෙර පැවති පාලනය ද එය ආණ්ඩුව තුළ පාලනය හිතුවක්කාර ලෙස හා ක්‍රමානුකූල ලෙස බාදනය කිරීම ද පිටුදැකීම සඳහා දෙවරක් ඡන්දය දුන්හ. ජනවාරියේ දී ජනාධිපති සිරිසේන තේරී පත් වී දැන් වසරකට ආසන්න කාලයක් ගත වී ඇතත් ආණ්ඩුව තුළ පාලන සංස්ථාපිතයේ මුදුනේ සිටින අයට ප්‍රමාණවත් අධිෂ්ඨානයක් සහ/හෝ හැකියාවක් නොමැති බවටත් සියලු දේශපාලනඥයන් එක සමාන බවටත් "ඩීල්වලින්" හැම විට ම පහර වදිනු ඇති බවටත් නුරුස්නා අදහසක් පතළ වී ඇත. ආණ්ඩුව පාලනයට හා දූෂණය "කිසි සේත්" ඉවසා නොදරන බවට කළ ප්‍රකාශයට පවත්නා කැප වීම යළි පණ ගන්වා ඔප්පු කිරීම හරහා මෙම හැඟීම ආපසු හැරවීමට පියවර නො ගෙන එය පුළුල්ව පැතිර යාමට ඉඩ දුන හොත් 2015 ජනවාරියේ හා අගෝස්තුවේ ලද ජයග්‍රහණ මාරක අනතුරකට මුහුණ පා පොදුවේ සියලු ප්‍රතිසංස්කරණ අනවශ්‍ය ලෙස හිර වීමකට ලක් වනු ඇත. මෙම තත්ත්වයට වගකිව යුත්තේ ආණ්ඩුව යි. විපක්ෂය නො වේ.

කඩිනම් හා තීරණාත්මක පියවරයන් අවශ්‍ය ය. දේශපාලනයේ දී හැඟීම් වැදගත් ය. මූලධර්ම හැම විට ම වැදගත් ය. පෙර පැවති පාලනය සහ ක්‍රියාකාරී දේශපාලනය තුළ සිටින එහි පන්දම්කාරයන් සිත් ගන්නාසුලු නිසා හෝ ආකර්ෂණීය විකල්පයක් ඉදිරිපත් කරන නිසා නො ව ආණ්ඩුව ඉතා ළඟ දී ම මූලධර්මවලින් හා කාර්ය සාධනයෙන් ඈත් වන බවක් පෙනී යන නිසා දේශපාලන බල තුලනය ඉක්මනින් වෙනස් විය හැකි ය.